ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 2488/41 – 2026 මැයි මස 13 වැනි බදාදා – 2026.05.13

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

මගේ අංකය: IR/COM/04/2016/54.

කාර්මික ආරාවුල් පනත 131 වන අධිකාරය

131 වන අධිකාරය වන සංශෝධිත කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තිය යටතේ 2025.12.23 දිනැති හා අංක 2468/14 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද 2025.12.12 දින දරන නියෝගයෙන්, එක් පාර්ශ්වයක් වශයෙන් කොළඹ 10, ආනන්ද රාජකරුණා මාවත, අංක 141 ලිපිනයෙහි පිහිටි නිදහස් වෙළඳ කලාප සහ පොදු සේවා සේවක සංගමය සහ කොළඹ 10, ශ්‍රී සංඝරාජ මාවත, අංක 98 ලිපිනයෙහි පිහිටි කැන්ඩි ඩිලයිට් ප්‍රයිවට් ලිමිටඩ් (ක්‍රිස් ෆූඩ්ස් ප්‍රයිවට් ලිමිටඩ් පෙර නම) අතර පවත්නා කාර්මික ආරාවුල බේරුම්කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා යොමු කරන ලදුව, බේරුම්කරු විසින් හා වෙත එවා ඇති අංක A/81/2025 හා 2026.03.03 දිනැති ප්‍රදානය එම පනතේ 18(1) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

**එච්. එම්. ඩී. එන්. කේ. වටලියද්ද,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2026 අප්‍රේල් මස 25 වැනි දින,
කම්කරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.

1A – G 046757 – 10 (2026/05)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

කොළඹ බේරුම්කරණ හා කාර්මික අධිකරණ ශාඛාවේදිය.

බේරුම්කරණ නීතිඥ ඕබඩගේ ලීලාරත්න මැතිතුමන් ඉදිරියේදීය.

නිදහස් වෙළඳ කලාප සහ පොදු සේවා සේවක සංගමය
අංක 141,
ආනන්ද රාජකරුණා මාවත,
කොළඹ 10,

*පළමු පාර්ශ්වය*

ආරාවුල් අංකය - IR/COM/04/2016/54
බේරුම්කරණ අංකය - A/81/2025

සහ

කැන්ඩි ඩිලයිට් (ප්‍රයිවට්) ලිමිටඩ්,
(ක්‍රිස් ෆුඩ්ස් ප්‍රයිවට් ලිමිටඩ් පෙර නම),
නො. 98,
ශ්‍රී සංඝරාජ මාවත,
කොළඹ 10

*දෙවන පාර්ශ්වය*

අතර පවත්නා කාර්මික ආරාවුල,

කම්කරු අමාත්‍ය ආචාර්ය අනිල් ජයන්ත ප්‍රනාන්දු මහතා විසින් 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් ( විශේෂ ප්‍රතිපාදන) පනත සමඟ කියවා) දරන පනත් වලින් සංශෝධිත වූ ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4 (1) වන වගන්තියෙන් ඔහු වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන් වර්ෂ 2025.12.12 වන දින මා පත් කොට මා වෙත යොමු කොට ඇත.

ඉහත දෙපාර්ශ්වය අතර පවත්නා කාර්මික ආරාවුලට හේතු පාදක වී ඇත්තේ,

"දෙපාර්ශ්වය අතර 1994-11-16 දින අත්සන් කරන ලද අවබෝධතා ගිවිසුම හා එහි යාවත්කාලීන කිරීම් වලදී ප්‍රසාද දීමනා ගෙවීම සඳහා එකඟතාවයක් ඇති වී තිබේද හා එසේ ඇති වී තිබේ නම් මෙම සේවකයින්ට ප්‍රසාද දීමනා සඳහා හිමිකම් තිබේද යන්නත් සහ මෙම පැමිණිල්ල ඉදිරිපත් කරනු ලබන වෘත්තීය සමිතියේ සාමාජිකයන් වන මෙම ආයතනයේ සේවය කරන ජේ. එම්. එස්. පෙරේරා මයා ඇතුළු සේවකයන් 38 දෙනාට ලබමින් සිටි වාර්ෂික ප්‍රසාද දීමනාවල 2015 අප්‍රේල් මාසයට නියමිත මුදලින් 25% ක් අඩුවෙන් ගෙවීමෙන් අසාධාරණයක් සිදුව තිබේද යන්න හා එසේ අසාධාරණයක් සිදුව තිබේ නම් ඔවුන්ට හිමිවිය යුතු සහන කවරේද යන්න පිළිබඳව වේ. "

ඇමුණුම-

1. ජේ. එම්. එස්. පෙරේරා
2. ජී. ආර්. ඒ. හේමන්තිකා
3. ඊ. ආර්. ආරියවතී
4. අයි. එස්. මාලනී.
5. ඕ.ජී.සී. ප්‍රසාදිනී
6. කේ. පී. කේ. සිල්වා
7. එම්. ඒ. ඩී. මල්ලිකා
8. කේ.එස්.ප්‍රනාන්දු
9. ඩබ්.ඒ. සුනේත්‍රා
10. එම්. පී. ආර්.ප්‍රනාන්දු
11. එම්.එස්. සිල්වා
12. එල්.සී.ජී.එස්. කුමාර
13. එස්. ඒ. ටී.හර්ෂ
14. එම්. ඩබ්. ඒ. ආර්. හරිස්චන්ද්‍ර
15. පී. කුමාරසිරි
16. එන්. ඒ.එල්.අනුරුද්ධ
20. කේ.එන්.ආර්.ප්‍රනාන්දු
21. ජී. ආර්. එල්. එන්.කේ. බණ්ඩාර
22. කේ.ආර්. එන්. ජයරත්න
23. ඩී. එම්. ටී. ඩී. මයිලැව
24. ඊ. එන්. ප්‍රියංකා
25. පී. ජී. ඩී. ප්‍රසාද්
26. ඩී. ටී. ඩී. ප්‍රනාන්දු
27. එච්. එම්. පී. සිල්වා
28. ආර්.එම්.ආර්. කේ. රත්නායක
29. කේ.පී. එස්. කුමාර
30. ආර්. එම්. ඒ එස්. සසලංක
31. ආර්. එම්. එම්. රත්තනායක
32. එස්.ආර්.එම්.පෙරේරා
33. බී.ඒ.ඩී.එස්.ඩී.තිසේරා
34. එන්. ඒ. එච්.ආර්.නිශ්ශංක
35. එම්.ඒ.ජේ.එස්.කේ. මල්ලවආරච්චි

17. එස්. එම්. ඒ. ඉන්ද්‍රාණි
18. එම්.එල්.සිල්වා
19. ටී. සී. එම්.ප්‍රනාන්දු
36. ටී. එම්. සී. එම්.තෙන්නකෝන්
37. එච්. ආර්. පී. සිල්වා
38. ඒ. ටී. එස්. නිරෝෂන්

පසුබිම.

මෙම ආරාවුලට හේතුපාදක වී ඇත්තේ 1994-11-16 දින අත්සන් කරන ලද අවබෝධතා ගිවිසුම හා එහි යාවත්කාලීන කිරීම්වලදී එහි 6 වගන්තියේ ඇති එකගතා වලට අනුව ප්‍රසාද දීමනාව ද එතුලට වැටෙන බව පවසමින් පළමු පාර්ශ්වය විසින් තම වෘත්තීය සමිති සාමාජිකයන් වන ඉහත නම් සඳහන් සේවකයන්ගේ 2015 අප්‍රේල් මස ලබාදුන් වාර්ෂික ප්‍රසාද දීමනාවට අදාලව ගෙවූ මුදලින් 25% ක් අඩුවෙන් ගෙවීම හේතු කොට ගෙන මෙම ආරාවුල පැන නැගී ඇත.

මේ සම්බන්ධයෙන් දෙපාර්ශ්වයේම පළමු හා දෙවැනි ප්‍රකාශ ගොනු කරන ලෙසට උපදෙස් ලබා දුන් අතර ඒ අනුව දෙපාර්ශ්වයම විසින් සිය පළමු ප්‍රකාශය මෙම ආරාවුල විභාගයට කැදවූ මුල් දිනයේදී ගොනු කරන ලදී. ඉන් අනතුරුව දෙවැනි ප්‍රකාශය ගොනු කිරීමට හා පරීක්ෂණය ආරම්භ කිරීම සඳහා 2026-02-27 දිනට, දින නියම කොට එදිනට දෙපාර්ශ්වයම කැඳවන ලදී.

මෙසේ පරීක්ෂණයට කැඳවූ අවස්ථාවේදී දෙපාර්ශ්වයම පරීක්ෂණය සඳහා ඉදිරිපත් වූ අතර, පළමු පාර්ශ්වය වෙනුවෙන් පෙනී සිටි නීතිඥ මහතා මෙම පරීක්ෂණයෙන් ඉවත් වන බව සටහන් කොට පරීක්ෂණ සභාවෙන් පිටව යන ලදී.

මෙදින පළමු පාර්ශ්වය වෙනුවෙන් පළමු පාර්ශ්විය වෘත්තීය සමිතියේ සමලේකම් ඇන්ටන් මාකස් මහතා සමඟ සංගමයේ සභාපති මංගලිකා මහත්මිය සහභාගී වූ අතර, වෘත්තීය සමිතියේ සමලේකම් ඇන්ටන් මාකස් මහතා කරුණු දක්වමින් මෙම බේරුම්කරණ නඩුවට අදාල සේවකයන් 38 දෙනා අතරින් බහුතරයක් මේ වන විට සේවයෙන් ඉවත්ව ගොස් ඇති බවත් ඉතිරිව සිටින සුළු සේවකයන් පිරිස මෙම නඩුව පවත්වා ගෙන යාමට උනන්දුවක් නොමැති බව තමාට දන්වා සිටි බවත් ඒ අනුව දෙවැනි පාර්ශ්වය වන ක්‍රිසි ෆුඩ්ස් සමාගමට එරෙහිව පවරා ඇති මෙම බේරුම්කරණ නඩුව තව දුරටත් පවත්වාගෙන යාමට අදහසක් නොමැති බැවින් මෙම බේරුම්කරණ නඩුව ඉල්ලා අස්කර ගන්නා බවත් දන්වා සිටින ලදී.

මේ සම්බන්ධයෙන් දෙවැනි පාර්ශ්වයේ නීතිඥ මහත්මිය කරුණු දක්වමින් පවසා සිටියේ අභියාචනාධිකරණයේ පැවති CAWrit/98/2020 අභියාචනාධිකරණ නඩුව අවසන් වීමෙන් පසුව නැවතත් A/81/2025 අංක යටතේ කම්කරු කොමසාරිස් ජනරාල් විසින් ඉදිරිපත් කරන ලද බේරුම්කරණයක් බවත් ඒ අනුව නැවතත් මෙම කරුණ සම්බන්ධයෙන් කිසිදු පැමිණිල්ලක් ඉදිරිපත් නොකරන බවට පළමු පාර්ශ්වය වගකීමක් ගන්නේ නම් මෙම බේරුම්කරණයෙන් මෙම නඩුව ඉල්ලා අස්කර ගැනීම සම්බන්ධයෙන් තමන් විරෝධතාවයක් නොදක්වන බවත්ය. (මෙම බේරුම්කරණයටම අදාලව මීට ප්‍රථම බේරුම්කරණ නඩුවක් යොමු කර තිබී ඇති අතර, එම බේරුම්කරණයේ යොමුව පිළිබඳව දෙවැනි පාර්ශ්වයේ තිබූ විරෝධතාවය මත අභියාචනාධිකරණය වෙත ගොස් රිට් ආඥාවක් ලබා ගෙන ඇති අතර, ඒ අනුව අධිකරණයෙන් කම්කරු කොමසාරිස් ජනරාල්වරයාට කර ඇති නියෝගයට අනුව යොමුව සංශෝධනය කොට නැවතත් නව බේරුම්කරණ අංකයක් යටතේ මෙම ආරාවුල මා වෙත යොමු කර ඇති බව අනාවරණය විය.)

ඒ අනුව පළමු පාර්ශ්විය වෘත්තීය සමිතියේ සමලේකම් ඇන්ටන් මාකස් මහතා ප්‍රකාශ කර සිටියේ මෙම කරුණ සම්බන්ධයෙන් නැවත පැමිණිලි කිසිවක් ඉදිරිපත් නොකරන බවයි.

**ප්‍රදානය**

ඉහත කරුණු සියල්ල සලකා බලා පළමු පාර්ශ්වයේ ඉල්ලීමට අනුව මෙම පැමිණිල්ල සම්බන්ධයෙන් නැවත නඩු නොපැවරීමේ එකගතාවයට යටත්ව මෙම නඩුව ඉල්ලා අස්කර ගැනීමට ඉඩ දෙමි.

ඒ අනුව මෙම බේරුම්කරණ නඩුව අවසන් කරමි.

අදාල බේරුම්කරණ නඩු ගොනුව පියවන්න. මෙය සාධාරණ හා යුක්ති සහගත තීරණයකි.

**නීතිඥ ඔබඩගේ ලීලාරත්න,**
**බේරුම්කරු.**

2026 මාර්තු මස 03 වැනි දින

EOG 05-0059

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.